**ජාතික මෝස්තර මධ්‍යස්ථානය - 2021**

**-------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**---------------------------------**

ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

-----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මධ්‍යස්ථානය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය , මධ්‍යස්ථානය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මධ්‍යස්ථානයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මධ්‍යස්ථානයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

-------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරනලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල මධ්‍යස්ථානයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම්ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

-------------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

------------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් ''මනාලෙස සැලසුම් කරන ලද'' අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

-----------------------------------------------------------------------

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිත 7 හි 47 වගන්තිය ප්‍රකාරව මුළු පිරිවැය රු 133,594,058 ක් වූ ගොඩනැගිලි, යන්ත්‍ර සූත්‍ර, පරිගණක, කාර්යාල උපකරණ, ලී බඩු හා සවි කිරීම්, මෙවලම් හා උපකරණ සහ පුස්තකාල පොත් වල ගිණුම්ගත කර ඇති අගය හා ඒවායේ සාධාරණ අගය සමාලෝචනය කර වත්කම් නැවත ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ගොඩනැගිලි යන්ත්‍ර සූත්‍ර පරිගණක කාර්යාල උපකරණ ලී බඩු හා සවි කිරීම් මෙවලම් හා උපකරණ සහ පුස්තකාල පොත් ආදිය වත්කම් පන්තීන් වශයෙන් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කරමින් පවතින අතර ඒ යටතේ ප්‍රධාන කාර්යාලයේ යන්ත්‍ර , උපකරණ හා මෙවලම් ප්‍රත්‍යාගණන කටයුතු මේ වන විට සිදුකර ඇති බව. | සියළු වත්කම් ප්‍රත්‍යාගණනයක් සිදු කොට සාධාරණ අගයකට මූල්‍ය ප්‍රකාශ වල දැක්විය යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිත 9 ප්‍රකාරව තොග හානියට පත්ව තිබේ නම් හෝ යල් පැන තිබේ නම් ඒ සඳහා ප්‍රතිපාදනයක් සිදුකර අවසන් තොගය පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය මත වටිනාකම් දෙකෙන් වඩා අඩු අගය තක්සේරු කර මූල්‍ය ප්‍රකාශවල දැක්විය යුතු වුවද අවසන් තොගයෙහි ශුද්ධ උපලබ්ධි අගය ගණනය කිරීමකින් තොරව එහි පිරිවැය වූ රු.5,561,132 අගයට තක්සේරු කර මූල්‍ය ප්‍රකාශ වල දක්වා තිබුණි | දැනට පවත්නා පැරණි තොග හැකිතාක් අලෙවි කිරීමටත් වසර තුළ තොග වටිනාකම් ආගණනය කර නව වටිනාකම් පොත්වලට ඇතුලත් කිරීමටත් උපදෙස් ලබා දී ඇති බව. | ගිණුම් ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |

## 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන එකතු වටිනාකම රු.72,409,350ක් වූ දේපළ පිරියත උපකරණ අයිතම් 05 ක වටිනාකම හා වත්කම් ලේඛනවල එම අගයන් සමඟ සැසඳීමේ දී රු.16,250,380 ක වෙනසක්ද, වත්කම් සමීක්ෂණ වාර්තා සමඟ සැසඳීමේ දී රු.19,388,241ක වෙනසක් නිරීක්ෂණය වුවද එම වෙනස්කම් පිළිබඳ සැසඳීම් කර නිවැරදි අගයන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂය තුළ වත්කම් පන්තීන් අනුව ප්‍රත්‍යාගණනය කිරීම හා ස්ථාවර වත්කම් ලේඛනය තවදුරටත් යාවත්කාලීන කිරීම මඟින් මෙම වෙනස අවම කිරීමට කටයුතු කරන බව. | ස්ථාවර වත්කම් සහ උපලේඛන අතර වෙනස්කම් හඳුනාගෙන නිරවුල් කිරීමට ක්‍රියා කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2016 දෙසැම්බර් 29 දින අංක 30/2016 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සෑම මාස 12ක කාල සීමාවකට පසුව හෝ කිලෝමීටර 25000ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව වාහන වල ඉන්ධන දහනය පරීක්ෂා කළ යුතු වුවත් මධ්‍යස්ථානයේ වාහන සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | සංචිත වාහන සියල්ල ඉතා කඩිනමින් ඉන්ධන දහනය පරීක්ෂා කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව . | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 371(5) | අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාල කාර්යය අවසන් කර දින 10ක් ඇතුළත එය නැවත පියවිය යුතු වුවද ආයතනය විසින් 2021 වර්ෂය තුල අවස්ථා 33 කදී ලබා දී තිබූ රු.1,160,710ක් වටිනා අත්තිකාරම් පියවීමට දින 12 සිට දින 71 දක්වා ප්‍රමාදයන් සිදුවී තිබුණි. | අත්තිකාරම් කඩිනමින් නිරවුල් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ කාර්ය මණ්ඩලය දැනුවත් කර ප්‍රමාදය අවම කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |

**2. මූල්‍ය සමාලෝචනය**

-----------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

-----------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 4,738,976 ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.8,045,574 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,306,598 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට භාණ්ඩාගාර ප්‍රදාන වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------------

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

---------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මෝස්තර නිෂ්පාදනය කිරීම සඳහා උපයෝගීකර ගන්නා ද්‍රව්‍ය සම්බන්ධ පර්යේෂණ කිරීම, භාරගැනීම හා ආනයනය කරනු ලබන අමුද්‍රව්‍ය වෙනුවට දේශීය අමුද්‍රව්‍ය උපයෝගී කර ගැනීම, ආදේශ ගැන සලකා බැලීම, එම ද්‍රව්‍ය වල තත්ත්වය හා ප්‍රමිතිය සම්බන්ධ නියම කරන ලද සහතික නිකුත් කිරීම, රසායනාගාර වැඩපොලවල් හා වෙනත් ආයතන පවත්වාගෙන යාම .මධ්‍යස්ථානයේ පර්යේෂණ අංශයේ කාර්යයන් වුවද මෙම අංශය සඳහා එක් මාණ්ඩලික නිලධාරියෙකු පමණක් අනුයුක්ත කර තිබුණි. මධ්‍යස්ථානය තුල මේ දක්වා රසායනාගාරයක් ස්ථාපිත කර නොතිබුණ අතර වාර්ෂිකව ඉතාමත් සුළු පර්යේෂණ ප්‍රමාණයක් පමණක් සිදුකර තිබුණි. මෙම පර්යේෂණ සම්බන්ධයෙන් ඒවා ශිල්පීන් විසින් කෙතෙක් දුරට යොදා ගන්නවාද, | පර්යේෂණ අංශය සංවර්ධනය කර ආයතන පනතට අදාල කාර්යයන් කාර්යක්ෂමව ඉටුකර ගැනීමට අවශ්‍ය සැලසුම් සහ කර්තව්‍යයන් ඉටුකිරීමට අවධානය යොමු කරනු ලබන බව. | පනතේ අරමුණු ඉටුවන ආකාරයට පර්යේෂණ අංශය ස්ථාපිත කළ යුතුයි. |

පර්යේෂණ වල සාර්ථකත්වය පිළිබඳ පසු විපරම් කිරීමත් මධ්‍යස්ථානය මඟින් සිදුකර නොතිබුණි. කර්මාන්ත සඳහා උපයෝගී කරගන්නා ද්‍රව්‍ය පිළිබඳ පර්යේෂණ සිදුකර ඒ ද්‍රව්‍ය වල තත්ත්වය හා ප්‍රමිතිය පිළිබඳ සහතික නිකුත් කිරීමක් මධ්‍යස්ථානය විසින් මේ දක්වා සිදුකර නොතිබුණි.

## 3.2 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික මෝස්තර මධ්‍යස්ථානය හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන එක්ව මඩකලපුව, මන්නාරම, වවුනියාව, අනුරාධපුරය, මොණරාගල, පුත්තලම හා අම්පාර යන දිස්ත්‍රික්ක වල හස්ත කර්මාන්ත ශිල්පින් හා ශිල්පීය කණ්ඩායම් සඳහා ශිල්පිය තාක්ෂණය, හැකියා සංවර්ධන හා උපදේශක සහාය ලබාදීම සඳහා 2015 අගෝස්තු 21 දින රු.46,715,763 ක වටිනාකමකට ගිවිසුම්ගත වී තිබුණි. 2017 දෙසැම්බර් 31 දක්වා රු.51,313,305 ක ප්‍රතිපාදන ලබා දී තිබුණ ද ගිවිසුම් කාලය දීර්ඝ කිරීමක් හෝ නව ගිවිසුමකට එළඹීමක් සිදුවී නොතිබුණි. ව්‍යාපෘතිය සඳහා ලද මුදලින් රු.14,806,278 ක් ඉතිරි වී ඇත. මෙම මුදලින් තවදුරටත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා 2019 වර්ෂයේ සිට රු.2,312,228 ක් ගිණුමේ රඳවාගෙන තිබුණ ද එයින් කිසිදු ව්‍යාපෘති කාර්යයක් සිදුකර නොතිබුණි. | මේ වන විට UNDP මඟින් අප ආයතනය වෙත පවරන ලද ව්‍යාපෘතියේ කටයුතු අවසන් කර ඇති බව හා එම ව්‍යාපෘතිය යටතේ ආයතතනයේ ඉතිරි මුදල වන රු.2,312,228 ක්‍රියාකාරි සැලැස්ම යටතේ ඵලදායී සංවර්ධන කටයුත්තක් වෙනුවෙන් වැය කිරීමට අපේක්ෂා කළ ද පසුගිය වසර තුළ රට තුළ පැවති කොවිඩ් වසංගතය හා අනෙකුත් ගැටළු හමුවේ එය ඉටු කර ගැනීමට නොහැකි විය. එහෙත් තත්ත්වය සාමාන්‍ය වූ විගස ඉදිරියේදී මෙම අරමුදල් ඵලදායී ක්‍රියාකාරකම් වෙනුවෙන් යෙදවීමට අපේක්ෂා කරන බව. | ලද ප්‍රතිපාදනයෙන් උපරිම ප්‍රයෝජන ලබාගෙන ව්‍යාපෘතියේ අරමුණු ඉටුවන ආකාරයට කටයුතු කළ යුතුයි. |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ මධ්‍යස්ථානය විසින් දින දහයේ බතික් පුහුණු පාඨමාලා ව්‍යාපෘති දහයක් පෞද්ගලික ආයතනයක් මඟින් ඉටුකරගෙන තිබුණි. රු.6,850,000ක මිලකට මෙකී සේවාව ලබාගැනීම සේවාදූත ආයතනයේ මිල ඇස්තමේන්තු මත ටෙන්ඩර් කැඳවීමකින් තොරව ලබාගැනීමට කටයුතු කර තිබුණි. | අවම මිලක් සහිත ලංසුවක් තෝරාගැනීමේ ක්‍රමවේදය අනුගමනය කිරීමට කාල වකවාණුව, රටේ තත්ත්වය, අමුද්‍රව්‍ය, විශේෂ වූ සම්පත්දායකයන් තෝරාගැනීමේ ක්‍රමවේද සඳහා කාලය වැය කිරීමට අවස්ථාවක් නොතිබුණ බව. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමෙන් අවම මිලක් සහිත ලංසුව තෝරා ගැනීම තුලින් ආයතනයට උපරිම වාසි සලසා ගැනීමට කටයුතු කළ යුතුයි. |
| (ආ) | ප්‍රධාන කාර්යාලයේ ශ්‍රවණාගාරය ප්‍රතිසංස්කරණය, නිර්මාණය කර සැකසීම සඳහා රු.4,999,001ක මිලකට සහ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ශාලාව නිර්මාණය කර සැකසීම සඳහා රු.2,498,569ක මිලකට පුද්ගලික ආයතනයකට කොන්ත්‍රාත්තුව ලබාදී තිබුණි. මෙම කොන්ත්‍රාත් දෙක "නිර්මාණය කර සැකසීම" සඳහා පළකර පුවත්පත් දැන්වීමේ කොන්ත්‍රාත් දෙකෙහි ඇස්තමේන්තු වටිනාකම සඳහන් කර තිබුණි. මේ හේතුවෙන් 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 (අ) ඡේදය ප්‍රකාරව මෙම ප්‍රසම්පාදනය තුලින් ආර්ථික වාසි සලසා ගැනීමට නොහැකි වී තිබුණි. එසේම "නිර්මාණයකර සැකසීමේ" ප්‍රසම්පාදන ක්‍රමය තෝරා ගැනීමට ප්‍රථම ඒ සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව ඇගයීමට ලක්කර ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | නිර්මාණය කර සැකසීම වෙනුවෙන් ගනු ලැබූ තීරණය සඳහා තාක්ෂණික හා ප්‍රසම්පාදන කමිටුවල ලිඛිත නිර්දේශය ලබාගෙන නොමැති බැවින් ඉදිරියේදී සිදු කරනු ලබන මෙවැනි කටයුතු වලදී අදාල උපදෙස් අනුගමනය කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුයි. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ කාර්යමණ්ඩලයේ අනුමත තනතුරු 114ක් පවතින අතර පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 36කි. එම පුරප්පාඩු තනතුරු වලින් ඇතැම් තනතුරු 2018 වර්ෂයේ ඔක්තෝබර් මාසයේ සිට පුරප්පාඩුව පැවතුණි. මේ හේතුවෙන් මධ්‍යස්ථානයේ ප්‍රධානතම තනතුර වන අධ්‍යක්ෂ තනතුර 2021 මැයි මස සිට පුරප්පාඩුව පැවතුණි. වසරක් ගත වී ඇතත් මෙම පුරප්පාඩු පිරවීමට මධ්‍යස්ථානය අපොහොසත් වී ඇත. | පිළිතුරු ලබාදී නොමැත. | අදාල අනුමැතිය ලබාගෙන බඳවාගැනීම් කළ යුතුයි. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මධ්‍යස්ථානය මඟින් 2021 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාකාරකම්, අරමුණු 22 ක් යටතේ සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ නිකුත් කළ අභ්‍යන්තර විගණන වාර්තා මඟින් ප්‍රමාණවත් පරිදි එකී සියළු ක්ෂේත්‍ර ආවරණය වී නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | සැලසුම් කළ පරිදි අභ්‍යන්තර විගණනය ක්‍රියාත්මක කළ යුතු අතරම අභ්‍යන්තර විගණනයේ සොයා ගැනීම් ආයතනයේ අභිවෘද්ධිය සඳහා යොදා ගැනීමටත්, කළමනාකරණය ක්‍රියා කළ යුතුය. |

### 4.2 අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය විෂයයන් 29 අදාලව එකතුව රු.30,162,000ක ප්‍රතිපාදන මුදලින් රු.12,449,815ක් උපයෝජනය කිරීම හේතුවෙන් රු.17,712,185ක ඉතිරියක් විය. එම ඉතිරිය සලසා තිබූ ප්‍රතිපාදන වලින් සියයට 34 සිට සියයට 99 දක්වා පරාසයක විහිදී පැවතුණි. | පිළිතුරු ලබාදී නොමැත. | අයවැය ඇස්තමේන්තුගත සීමාවන් තුළ වියදම් දැරීමට ක්‍රියා කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වැය විෂයයන් 04ට අදාලව සලසාගෙන තිබූ රු.540,000ක ප්‍රතිපාදන උපයෝජනය නොකර ඉතිරිව පැවතුණ අතර වැය විෂයයන් 03 ට අදාලව වියදම රු.2,167,611ක් වූ අතර ප්‍රතිපාදනය රු.1,450,000ක් වූයෙන් රු.717,611කින් ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය ඉක්මවා තිබුණි. වැය විෂයයන් 04ට අදාලව රු.659,191ක් ඇස්තමේන්තු කිරීමකින් තොරව වැයකර තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | අයවැය ඇස්තමේන්තුගත සීමාවන් තුළ වියදම් දැරීමට ක්‍රියා කළ යුතුයි. |